# පාලි ත්‍රිපිටකය පෝෂණය කිරීම විෂයෙහි ශ්‍රී ලාංකික දායකත්වය (සාහිත්‍යය මූලාශ්‍රය ඇසුරෙනි)

පූජ්‍ය වීරකැටියේ චන්ද්‍රානන්ද හිමි*

පළමු සංගීතයෙහි ද අනුසංගීතින්හිද සංගෘහිත වූ පාලි ත්‍රිපිටකය මිහිඳු මහරහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවට ගෙන එන ලදැයි මුල් නිකාය චතුස්කයට ම බුද්ධඝෝෂ මාහිමියන් කළ අටුවාවල සඳහන් ය. ''සීහළදීපං පන ආභතාථ වසිනා මහාමහින්‍දොති.'' මෙමගින් පාලි ත්‍රිපිටකය ද උන්වහන්සේ ගෙන ආ බව ගම්‍යමාන වෙයි. දීපවංසය හා මහාවංසයත් පාලි අට්ඨකථාත් විමසන්නෙකුට පාලි ත්‍රිපිටකය හා පාලි අටුවාවන් ශ්‍රී ලංකාවට ගෙන ආවේ මිහිඳු මහරහතන් වහන්සේ බව මනාව සනාථ කර ගත හැකි ය. ත්‍රිපිටකය නම් විනය පිටකය, සූත්‍ර පිටකය සහ අභිධර්ම පිටකයයි. ඉන් විනය පිටකය පාරාජිකපාලි, පාචිත්තියයාලි, මහාවග්ගපාලි, චුල්ලවග්ගපාලි සහ පරිවාරපාලි යන ග්‍රන්ථ පසෙන් පරිමිතයඃ සූත්‍ර පිටකය දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අංගුත්තරනිකාය සහ ඛුද්දකනිකාය යන පඤ්චනිකායෙන් පිරිපුන්ය. ඉනුත් ඛුද්දනිකාය, ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු, ජේතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිදාමග්ග, අපදාන, බුද්ධවංස සහ චරියාපිටක යන ධර්ම ග්‍රන්ථයන්ගෙන් සමන්විතය. අභිධර්ම පිටකය, ධම්මසංගණී, විභංග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක සහ පට්ඨාන යන ප්‍රකරණ සතෙන් යුක්තය. ත්‍රිපිටකය හැටියට පිළිගනු ලබන මේ ධර්ම ග්‍රන්ථ තිස් එක ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේදී මිහිඳු මහරතන්වහන්සේ විසින් ගෙන එන ලද ආකාරයෙන්ම දැනුත් විද්‍යාමාන බව බොහෝ දෙනාගේ අදහසය. එහෙත් තත්ත්වය එසේ නොවන බවත් අධ්‍යාරෝපිතයන්ගෙන් හා සංස්කරණ හේතුවෙන් පාලි ත්‍රිපිටකය ශ්‍රී ලංකාවේ දී වෙනස්කම්වලට භාජනය වූ බවත් කරුණු පරීක්‍ෂා කිරීමේදී පෙනී යයි. පාලි ත්‍රිපිටකය ආරක්‍ෂා කිරීම විෂයෙහි මතු නොව පෝෂණය කිරීම විෂයෙහි ද ශ්‍රී ලංකාව දායක වී ඇති බව ඓතිහාසිකව පැහැදිලිය. මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයෙන් පසුව ථේරවාද සම්ප්‍රාදයේ මධ්‍යස්ථානය වූයේ ශ්‍රී ලංකාව ය. ශත වර්ෂ තුනක පමණ කාලයක් තිස්සේ පාලි ත්‍රිපිටකය මුඛ පරම්පරාගතව පවත්වා ගෙන ආවේ ශ්‍රී ලාංකික ආචාර්යවරුන් විසිනි. ග්‍රන්ථාරූඪයෙන් පසුවද එය ආරක්‍ෂා කිරීමේ වගකීම පැවරුණේ ශ්‍රී ලංකාවට ය. පාලි අට්ටකථා සිංහලට පරිවර්තනය කොට ශත වර්ෂ අටක් පමණ ඉක්ම ගිය තැන යුගයේ අවශ්‍යතා සලකා හෙලටුවා යලි පාලියට පරිවර්තනය කිරීම සිදු වුයේ මහාවිහාර භික්ෂුන් වහන්සේලාගේ අධීක්‍ෂණය යටතේ ශ්‍රී ලංකාවේය. මේ නයින් ථෙරවාද ත්‍රිපිටකය ආරක්‍ෂා කිරීමට ශ්‍රී ලාංකික ආචාර්යවරුන් දැරූ උත්සාහයයේ ආනුෂංගික කාර්යයක් ලෙස ඇතැම් ත්‍රිපිටක ග්‍රන්ථ මෙහිදී සංස්කරණයට භාජනය වීම ස්වාභාවික ය. ආගමික සාහිත්‍යයන් ඉතිහාසය තුළ මෙබඳු වෙනස්කම්වලට ලක්වීම පුදුම විය යුත්තක් නොවේ. පුදුමය නම් ප්‍රමාණයෙන් අති මහත් වූ තථාගත ධර්මය බරපතල දුෂණවලට ගොදුරු වීමට ඉඩ නොදී දැනට දක්නා පරිද්දෙන් ආරක්‍ෂා කර ගැනීමය. මෙම පර්යේෂණයේ පරමාර්ථය පාලි ත්‍රිපිටකය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී සිදු වූ වෙනස්කම් පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් අධ්‍යයනය කිරීමයි.

ප්‍රමුඛ පද : අට්ඨකතා, ටීකා, ත්‍රිපිටකය, බුද්ධඝෝෂ, මහින්දාගමනය.

* පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය අධ්‍යයන අංශය wcnanda90@gmail.com